**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය - 2010**

---------------------------------------------------

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මතය</u>**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.2.1 **උසස් ගිණුම්කරණ පරිචයන්**

--------------------------------

ආයතනයට එරෙහිව පවරා ඇති නඩුවක් අනුව ගෙවීමට සිදු විය හැකි අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 **<u>ගණම්කරණ අඩුපාඩු</u>**

බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ගනුදෙනුවලට අදාලව ලෙජරයේ වෙනමම ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර මෙම පුහුණු මධ්‍යස්ථානයට අදාල වියදම් ලෙජරයට පිටපත් කිරීමේදී රු.1,525,545 ක වෙනසක් සිදු වී තිබුණි.

## 1.3 <u>නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම</u>

පහත දැක්වෙන නීති, රීති , රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති ,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| අ) | 1979 අංක 45 දරන ජාතික වැව්ලි කලමනාකරණ ආයතන පනත | ඇමතිවරයා විසින් පත් කල යුතු බවට සඳහන් ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ තනතුර 2010 ඔක්තෝබර් 12 දින සිට මේ දක්වාම පුරප්පාඩුව පැවතුණි. |
| ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ 153 වගන්තිය | රු.50,000ට වැඩි ගෙවීම් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බදු අඩු කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ එක් අවස්ථාවකදී රු. 161,720 ක් සම්බන්ධයෙන් අදාල බදු මුදල් අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| ඇ) | 2003 ජුනි 2 දිනැති පී.ඊ.ඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 ඡේදය | සෑම මසකම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් 7 ක් පමණක් පවත්වා තිබුණි. |
| ඈ) | මුදල් රෙගුලාසි 156(5) | ගිණුම්වල හා ඒ හා සම්බන්ධ ලියවිල්ලක සටහන් මකා දැමීම නොකල යුතු අතර වරදක් නිවැරදි කල යුත්තේ වෙනස් කල යුතු වචන හා ඉලක්කම් ආදිය තනි රතු ඉරකින් කපා එම වෙනස්කම් වලට ඉහලින් නිවැරදි වචන හා ඉලක්කම් රතු තීන්තෙන් ලියා ඒවා වගකිව යුතු නිලධාරියෙකු සිය කෙටිසන් යොදා සහතික කල පසුව වුවත් මුදල් පොතේ ගනුදෙනු සටහන් කිරීමේදී හා ගෙවීම් වවුචර් පිලියෙල කිරීමේදී එකී නියමයන් අනුගමනය නොකර වෙනස් කිරීම් කර ගෙවීම් කර තිබුණි. |

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය සමාලෝචනය</u>

( අ) <u>මූල්‍ය ප්‍රතඵල</u>

(i) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ලැබුණු රු.10,505,200 ක භාණ්ඩාගාර ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ වැඩකටයුතු වල ප්‍රතිඵලය රු. 1,511,302 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ලැබුණු රු. 13,100,000ක භාණ්ඩාගාර ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසුව ඉකුත් වර්ෂයේ රු.1,317,913 ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.2,829,215 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

(ii) 2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේදි පාඨමාලා ආදායම් හා විවිධ ආදායම් රු. 16,215,279 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

(i) ආයතනයේ සමස්ථ ආදායමින් රු.මිලියන 10 ක් හෙවත් 31% ක් භාණ්ඩාගාර ප්‍රදානවලින්ද, රු. මිලියන 23 ක් හෙවත් 69 % ක් ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයාගත් ආදායම් වලින්ද සමන්විත වී තිබුණි.

(ii) ආයතනයේ සමස්ථ වියදමින් 72 %ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයා ගනු ලැබූ ආදායම්වලින් ආවරණය වී තිබුණි.

2.2 <u>මෙහෙයුම් සමාලෝචනය</u>

2.2.1 <u>කාර්ය සාධනය</u>

| වර්ෂය | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|---|---|---|---|
| පැවැත්වූ පාඨමාලා | 227 | 108 | 129 | 9 | 24 | 73 | 75 | 6 | 45 |
| සහභාගිවූවන් | 8721 | 4451 | 3545 | 266 | 663 | 3417 | 3694 | 346 | 1449 |

අ) 2002 වර්ෂයේදි පුහුණු පාඨමාලා 227 ක් පවත්වා තිබූ අතර 2010 වර්ෂයේදි එය පාඨමාලා 45 ක් දක්වා අඩු වී තිබුණි. 2002 හා සසඳන කල පාඨමාලා පැවැත්වීමේ ප්‍රතිශතය 2010 වර්ෂයේදි 20 % ක් දක්වා අඩු වී ඇත.

2004 වර්ෂයට පසු පැවැත්වූ පුහුණු පාඨමාලා ප්‍රමාණය අඩුවීමට හේතුව වූයේ 2004 නොවැම්බර් මාසයේදි ක්‍රියාත්මක කරන ලද ප්‍රතිව්‍යුහකරන වැඩපිළිවෙලයි. ඒ යටතේ ආයතනයේ සේවකයින් 35 දෙනෙකු සේවයෙන් ඉවත් වූ අතර ඒ තුල පුහුණු අංශයට අනුයුක්ත කරන ලද 11 දෙනකු සිටි අතර ඉතිරි වූයේ පුහුණු නිලධාරීන් තිදෙනකු පමණි. ඊට අමතරව ප්‍රතිව්‍යුහකරන වැඩපිළිවෙල නිසා ආයතනය වසා ඇති බවට රාවයක් වැවිලි ක්ෂේත්‍රය තුල පැතිරිණි. මේ හේත නිසා 2002 වර්ෂයට සාපේක්ෂව 2005 සිට 2010 දක්වා කාලය තුල පැවැත් වූ පුහුණු පාඨමාලා ප්‍රමාණය අඩුවී තිබූ බව සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

ආ) 2002 වර්ෂයේදි පාඨමාලා සඳහා සහභාගි වූ සංඛ්‍යාව 8721 ක් වූ අතර 2010 වර්ෂයේදි 1449ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව 2002 වර්ෂයට සාපේක්ෂව සහභාගි වූවන්ගේ ප්‍රතිශතය 2010 වර්ෂයේදි 17 % ක් දක්වා අඩු වී තිබුණි.

ඇ) 1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනතේ 3 වගන්තිය යටතේ වැවිලි කළමනාකරණය සම්බන්ධව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සම්මන්ත්‍රණ, වැඩමුළු, සමුළු සංවිධානය කිරීම හා සඟරා පොත් නිකුත් කිරීම මූලික අරමුණු වී තිබුණි.

එසේ වුවත් වැවිලි ක්ෂේත්‍රයේ රැකියාවල නිරත වන සේවක සංඛ්‍යාව මිලියන 2 කට අධික ප්‍රමාණයක් පමණ වන නමුත් 2010 වර්ෂය තුලදී ආයතනය විසින් පුහුණු කර තිබුණේ සේවකයින් 1449 කි. එනම් 0.07 % පමණි.

ඈ) ආයතනයේ 2010 වර්ෂයේ මෙහෙයුම් ආදායම පහත පරිදි විය.

| | රු. 000 |
|---|---|
| පුහුණු වැඩසටහන් වලින් ආදායම | 10,396 |
| ගොඩනැගිලි කුලියට දීමෙන් ලද ආදායම | 11,203 |
| පොලී ආදායම් | 1,014 |
| විවිධ ආදායම් | 438 |

මෙහෙයුම් ආදායමින් වැඩි ප්‍රමාණයක් ගොඩනැගිලි කුලියට දීමෙන් උපයාගෙන තිබුණි.

### 2.2.2 පාඨමාලා පැවැත්වීම 2010

| 2010 වර්ෂය වෙනුවෙන් සැලසුම් කරන ලද පාඨමාලාවේ නම | ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කල ප්‍රමාණය | තථ්‍ය පාඨමාලා ප්‍රමාණය |
|---|---|---|
| අධ්‍යාපන හා වෘත්තීය වැඩසටහන් | 14 | 8 |
| තාක්ෂණ සංවර්ධන වැඩසටහන් | 4 | - |
| කුසලතා සංවර්ධන වැඩසටහන් | 4 | 5 |
| ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන් | 35 | 8 |
| විශේෂ පුහුණු වැඩසටහන් | 10 | 13 |
| කළමනාකරණ පුහුණු වැඩසටහන් | 6 | 6 |
| විදේශ පුහුණු වැඩසටහන් | 1 | 1 |
| ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් | 3 | 3 |
| වැවිලි පුහුණුකරුවන් සඳහා හඳුන්වාදීමේ වැඩසටහන් | 1 | 1 |

අ) තාක්ෂණ සංවර්ධන පාඨමාලා 4 ක් පවත්වා 60 දෙනකු පුහුණු කිරීමට ඉලක්ක කර තිබූ නමුත් මෙම පාඨමාලාව පවත්වා නොතිබුණි.

ආ) වගාකරන්නන් පුහුණුකිරීම සඳහා වන පාඨමාලා 35ක් පවත්වා, 1750 දෙනකු පුහුණු කිරීමට ඉලක්ක ගත කර තිබූ නමුත් පාඨමාලා 8 ක් පමණක් පවත්වා 257 දෙනකු පමණක් පුහුණු කර තිබුණි.

### 2.3 ආයතනයේ සම්පත් වෙනත් ආයතන ප්‍රයෝජනයට ගැනීම

ආයතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ ප්‍රයෝජනය සඳහා රු.1,224,380 කට මිලදී ගෙන තිබුණු සෝනි වර්ගයේ වීඩියෝ කැමරාව 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව මිලදී ගත් දින සිට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා යොදවා තිබුණි.

2.4 <u>අභ්‍යන්තර විගණනය</u>

1971 අංක 38 දරන මුදල් පනතේ 13 (5) (ඩී) හා අංක පීඊඩී 12 දරන 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.7.5 වගන්තිය අනුව මෙම ආයතනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

2.5 <u>නිශ්කාර්ය වත්කම් හා අස්ථානගත වූ භාණ්ඩ</u>

(අ) වර්ග අඩි 1505 ක අධ්‍යක්ෂ නිල නිවස හා වර්ග අඩි 745 ක ශ්‍රව්‍ය දෘශ්‍ය අංශය 2004 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි.

(ආ) දැනට භාවිතා නොකරන භාණ්ඩ 109ක්, ක්‍රියා විරහිත භාණ්ඩ 33ක් හා පලුදු වූ හා කැඩුණු භාණ්ඩ 77 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) කැසට් රෙකෝඩර් හා ප්‍රොජෙක්ටර් යන භාණ්ඩ අස්ථානගත වී තිබුණු අතර ඒ සම්බන්ධව මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.6 <u>සංයුක්ත සැලැස්ම ක්‍රියාකාරී සැලැස්ම සමඟ සමරූපී ලෙස පවත්වාගෙන නොතිබීම.</u>

2010 - 2015 වර්ෂ ආවරණය වන පරිදි සකසා තිබූ සංයුක්ත සැලැසුම ප්‍රකාර හා 2010 ක්‍රියාකාරී සැලැසුමේ වැඩසටහන් අනුව ප්‍රතිපාදිත මුදල් අතර 11 % සිට 455 % ක් දක්වා වූ වෙනස්කම් තිබුණි.

2.7 <u>අයවැය ලේඛණය</u>

ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී පිළියෙල කර තිබූ අයවැය ලේඛණයේ ඇස්තමේන්තු ගත වියදම හා තථ්‍ය වියදම සැසඳීමේදී 12% සිට 100% දක්වා පරාසයක් තුල වූ විචලනයන් නිරීක්ෂණය වූ අතර ඇස්තමේන්තු ගත ආදායම හා තථ්‍ය ආදායම සැසදීමේදී 37% සිට 134% දක්වා පරාසයක විචලනයන් දිස්විය. මේ අනුව අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

අ) ගිණුම්කරණය

ආ) මිලදී ගැනීම්

ඇ) පාඨමාලා පැවැත්වීම